


පූජ්‍ය උඩුදුම්බර
කාශ්‍යප ස්වාමීන්වහන්සේ

**මෙල්බර්න්හි බෙරික් බෞද්ධ විහාරස්ථානයේ වාර්ෂික භාවනා පුහුණු වැඩසටහන ආරම්භ කරමින් පූජ්‍ය උඩුදුම්බර කාශ්‍යප ස්වාමීන්වහන්සේ පැවැත්වූ ප්‍රථම ධර්ම දේශනාවේ ලේඛනගත පස්වන කොටසයි මේ. ඉදිරියේදී උන්වහන්සේ විසින් පවත්වන භාවනා පුහුණු වැඩසටහන්වලට සහභාගීවීමට උනන්දුවක් දක්වන 'සන්නස' පාඨකයන්ට පූර්ව කටයුතු සම්පාදනයෙහිලා මේ ලිපි පෙළ වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.**

# මරණය දක්වා දිගු ගමනක

අපට අවබෝධ වන්නේ එවිටය. ඒ විඤ්ඤාණයේ (සිතේ) ස්වාභාවය යි. විඤ්ඤාණය අපට අවශ්‍ය තැන, අපට අවශ්‍ය ආකාරයෙන් පිහිටන්නේ නම් ගුරුවරයා පාඩමක් උගන්වන වෙලාවේ එහිම පිහිටිය යුතුය. එහෙත් එය එසේ නොවේ. විටෙක ගුරුවරයා උගන්වන පාඩමේද තවත් විටෙක වෙනත් තැනක වෙනත් අරමුණකද නැවත පාඩමේද ආදී වශයෙන් විඤ්ඤාණය විවිධ අරමුණුවල බැස ගන්නේ අපගේ අවසරයකින් තොරවය.

විඤ්ඤාණය සකස් වන්නේද අපට අවශ්‍ය තැන, අපට අවශ්‍ය ආකාරයෙන් නොව, එයට අවශ්‍ය තැන, එයට අවශ්‍ය ආකාරයෙනි. එසේ වන්නේ යම් හේතුවක ඵලයක් වශයෙනි. හේතුවක ඵලයක් ලෙස සකස් වන්නක් මිස විඤ්ඤාණයද අපට අවශ්‍ය ආකාරයෙන් අපගේ වසඟයෙහි පවත්නා දෙයක් නොවන ධර්මතාවක් බව මෙයින් ද පැහැදිලිය.

විඤ්ඤාණය (සිත) සකස් වන්නේ කරුණු තුනක් සම්පූර්ණ වීමෙනි. ඇස ආශ්‍රයෙන් එය මෙසේ පැහැදිලි කරගත හැකිය.

පාසල් වියේදී ගුරුවරුන්ගෙන් රට හුණු කෑල්ලෙන් ගුටි කෑ අවස්ථාවන් ඔබට මතකද? අපි ගුරුවරයා දෙස හොඳින් බලා සිටියෙමු. පන්ති කාමරයේ අසුන් ගෙන එසේ ගුරුවරයා දෙස බලා සිටියද අප සිටින්නේ මේ ලෝකයේ නොවන බව ගුරුවරයා හොඳින්ම දැනගන්නා අවස්ථාවලදී ගුරුවරයා යළි අප පාඩම වෙත කැඳවන්නේ රට හුණු කෑල්ලක් ගුවනේ පා කොට අප වෙත එවීමෙනි.
එය මුහුණේ වැදුණු විට අපි පියවි සිහියට පත්වේ. එතෙක් අප කායිකව පන්ති කාමරයේ අසුන් ගෙන ගුරුවරයා දෙස බලා සිටියද සිත තිබී ඇත්තේ වෙනත් කොහෝ හෝ බව

ඇසේ විඤ්ඤාණය (හෙවත් ඇසේ සිත. හෙවත් ඇසේ දැනීම) සකස් වීමට කරුණු තුනක් සම්පූර්ණ විය යුතුය. ඇසක් තිබිය යුතුය. බාහිර ලෝකයේ රූපයක් තිබිය යුතුය. සිතක් තිබිය යුතුය. මේ තුන එක් වූ කල්හි හෙවත් එකිනෙක ස්පර්ශ වූ කල්හි එම ස්පර්ශවීම හේතුවී වේදනාවක් ඇතිවේ. එලෙස

ඇතිවන වේදනාව සැප වේදනාවක්, දුක් වේදනාවක් හෝ ඒ දෙකටම නොවැටෙන මධ්‍යස්ථ වේදනාවක් විය හැකිය. එම වේදනාව හේතුවී සිතේ ඒ පිළිබඳ සකස්වීමක් හෙවත් සංස්කාරයක් ඇතිවේ. එහි ඵලය ලෙස මම මේ රූපය දකින්නේ යැයි හැඟීමක් හෙවත් ඇසේ විඤ්ඤාණය ඇතිවේ. එනම් යම් රූපයක් දුටු බවට හඳුනාගැනීමක් ඇතිවේ. ඇසේ විඤ්ඤාණය සකස් වන්නේ එලෙසිනි.

රූපය ඇත්තේ බාහිර ලෝකයේ ය. බාහිර ලෝකයේ ඇති රූපයක් යනු ඔබට අවශ්‍ය ආකාරයෙන් පවතින්නක් නොවේ. ඊට ආවේනික ස්වාභාවයකින් ඇතිවී, පැවතී, නැතිවන්නකි. ඇස අභ්‍යන්තර ආයතනයකි. එයද ඔබට අවශ්‍ය ආකාරයෙන් පවතින්නක් නොව ඊට ආවේනික ස්වාභාවයකින් ඇතිවී, පැවතී, නැතිවන්නකි. කුඩා දරුවකු අවධියේ දීප්තිමත් සුදු පැහැයෙන් පැවති ඇස් වයස්ගත වෙද්දී අඳුරු අවර්ණ ස්වාභාවයට පත්වන්නේත්, ඒ අතර කාලයේ ඇස් රෝග, හදිසි අනතුරු ආදියෙන් තුවාල, හතලිස් ඇඳිරිය, සුද මතුවීම ආදී නොයෙකුත් ව්‍යාධීන්ට ලක්වන්නේත්, අවසානයේදී කොතරම් නිරෝගී අයෙකු වුවද ඔබ ජීවත්ව සිටියදීම ඇස් පෙනීම දුර්වලවී ඇතැම් විට අහිමිවී යන්නේත් ඇස ඔබගේ කැමැත්තට අනුව පවතින්නක් නොවන බැවිනි.
මෙලෙස ඔබගේ පාලනයෙන් තොර රූපය සහ ඇස එකිනෙක ගැටීමෙන් හටගන්නා ඇසේ විඤ්ඤාණය ඔබට වුවමනා ආකාරයෙන් හටගනු ඇතැයි බලාපොරොත්තු විය හැකිද? නොහැකිය. ඔබගේ කැමැත්ත මත රඳා නොපවතින රූපයකුත් ඔබගේ කැමැත්ත මත රඳා නොපවතින ඇසකුත් හේතු වී හටගන්නා විඤ්ඤාණයද ඔබගේ කැමැත්ත මත රඳා නොපවතින අහම්භයකි. චක්ඛු සම්ඵස්සය ලෙසින් එය හැඳින්වේ.

කණ, නාසය, දිව, ශරීරය ආදී අනෙකුත් ආයතන ආශ්‍රයෙන් හටගන්නා සෙසු විඤ්ඤාණ්යන්හි ස්වාභාවයද මෙයම මිස අනෙකක් නොවේ. ඒවාට අදාළව විමසා බැලීමෙන් ඔබටම එය අවබෝධ වනු ඇත. බාහිර ලෝකයේ ඇති ශබ්ද ඔබගේ කැමැත්ත මත රඳා නොපවතී. ඒ ශබ්ද ගැටෙන අභ්‍යන්තර ඉන්ද්‍රිය වන කණ ඔබගේ කැමැත්ත මත රඳා නොපවතී. ඔබ කැමැති මෙන්ම අකමැති ශබ්ද ද වෙනසකින් තොරව කණ ග්‍රහණය කරගනී. ඒ දෙකේ එක්වීමෙන් හටගන්නා කණේ විඤ්ඤාණයද ඔබගේ කැමැත්ත අනුව ඇති නොවේ. එබැවින් කණේ විඤ්ඤාණයද ඔබගේ පාලනයෙන් බැහැරය. විඤ්ඤාණයද ''මගේ'' නොවන බව මෙලෙස විමසා බැලීමෙන් අවසන් වශයෙන් ඔබට පැහැදිලි විය යුතු ය.

කරුණු එසේ තිබියදී ඔබත්, මමත් 'මම' ය, 'මාගේ' ය යැයි සිතිවිලි ගනිමින් උපතේ සිට මරණය දක්වා දිගු ගමනක නිරතව සිටිමු. ඒ අතර මම සහ මගේ දේවල් වෙනුවෙන් සතුන් මරයි. සොරකම් කරයි. බොරු කියයි. කේලාම් කියයි. අපාගත වන වැරදි සිදුකරයි. ඒ සියල්ල කරන්නේ පවතින දෙයක් වෙනුවෙන් නොව නොපවතින දෙයක් වෙනුවෙන් හෙවත් 'මම'ක් වෙනුවෙන් බව දැන් ඔබට පැහැදිලි විය යුතුය. ඒ 'මම' ඇසින් රූපද, කණෙන් ශබ්ද ද, නාසයෙන් ගඳ ද, දිවෙන් රස ද, කයෙන් ස්පර්ශ ද, මනසින් ධර්ම ද ගෙන ඒවා දැඩිව අල්ලා ගනී. හෙවත් උපාදානය කරගනී. එලෙස අල්ලා ගැනීම හේතුවී දුකට පත්වේ.

දුක පිළිබඳ විස්තර කිරීමේදී බුදු හාමුදුරුවෝ දේශනා කළේ සංක්ෂිප්තව දක්වතොත් පංච උපාදාන ස්බන්ධයෝම දුක බවය. බුදු හාමුදුරුවෝ එසේ දේශනා කොට තිබුණද අප බොහෝ දෙනෙකුට දැනෙන්නේ පංච උපාදාන ස්බන්ධයෝ සැප ලෙසටය. එනම් එහි සැබෑ ස්වාභාවය වෙනුවට වෙනත් ස්වාභාවයකිනි. 'වයර් මාරුව' සිදුවූ කැල්කියුලේටරයක පහේ ඉලක්කම ඔබන විට හතේ ඉලක්කම දිස්වන්නාක් මෙනි. එහෙත් මේ දෝෂය පිළිබඳ අපට නිවැරදි අවබෝධයක් නොමැති හෙයින් එයින් ගැලවීමට නොහැකිවී එහිම ගිළී සිටින්නෙමු.
අපි මින් පෙර දැක්වූ 'සත්පුරුෂයකු' පිළිබඳ නිදසුන නැවත සිහිපත් කර ගනිමු. සත් පුරුෂයෙකු ලෙස අපි හඳුනාගෙන සිටින අයෙකු දකින විට අප තුළ ඇති වන්නේ සැප වේදනාවකි. පසුව එම පුද්ගලයා අසත් පුරුෂයෙකු බව දැනගන්නට ලැබුණේ නම් ඉන් පසුව ඔහු දකින විට පෙර මෙන් සැප වේදනාවක් ඇතිවන්නේ නැත. ඒ වෙනුවට ඇතිවන්නේ දුක් වේදනාවකි. පළමු අවස්ථාවේ අපට කිසියම් වැරදීමක් සිදුව ඇත. සිදුව ඇති වරද කුමක්ද? 'අසත් පුරුෂයා' අසත් පුරුෂයා වශයෙන් නොදැනීමය. ඒ නොදැනීම නිසා දුක් ඇතිවිය යුතු තැනක සැප ඇතිවිය. දැනීම පැමිණි වහාම දුක ඇතිවිය යුතු තැන දුකම හට ගැනීම විය.

අපගේ සිතෙහි ක්‍රියාත්මකභාවය හෙවත් මනසිකාරයද කැල්කියුලේටරයක, පරිගණකයක ක්‍රියාකාරිත්වයට සමානය. පරිගණකයකින් එළියට එන සංඥා සකස්



43 වන පිටට